# බෞද්ධ ස්තූපයේ විකාශය හා ඉන් ප්‍රකාශිත ධර්ම සන්නිවේදනය

පූජ්‍ය. ඕපාත සමිත හිමි*

ලෝකයේ සියලු බෞද්ධ ජනයාගේම ගෞරවාදරයට මෙන්ම වන්දනාවට බඳුන් වන අතිපූජනීය වස්තුවක් වශයෙන් ස්තූපය හඳුන්වාදිය හැකිය. ව්‍යවහාරාත්මක වශයෙන් ස්තූපය සඳහා දාගැබ, තුඹ, සෑය, වෙහෙර, ථූප, චේතිය, චෛත්‍යය යන අපර නාමයන් භාවිත කරණු ලබයි. මෙහි සඳහන් ස්තූප යන්න සීමිත අරුතක් සඳහා භාවිත බව උගතුන්ගේ මතයයි. නමුත් චෛත්‍යය යන්නෙන් පුළුල් අර්ථයක් ගම්‍ය වේ. ඕනෑම ස්තූපයක් චෛත්‍යයක් වන නමුත් ඕනෑම චෛත්‍යයක් ස්තූපයක් වශයෙන් හඳුන්වාදිය නොහැකිය. ස්තූප පිළිබඳ අධ්‍යයනය කිරීමට මත්තෙන් එම වචනාර්ථය පිළිබඳ යම් අවබෝධයක් ලබා ගැනීම වටී. ස්තූප යන්නෙන් ''භෂ්මාවශේෂ තැන්පත් කොට ගොඩනගන ලද'' යන්න අර්ථවත් වේ. ස්තූප් ධාතුවෙන් ඉහලට ගොඩ නැගීම, ගොනුකිරීම යන අර්ථ ජනනය කරනු ලබයි. භාෂා විශේෂඥයන්ගේ මතයට අනුව චේතිය යන්නෙන් ''ගොඩනැගීම'' යන්න අර්ථවත් වේ. සිංහල බසින් මෙය දාගැබ වශයෙන් හඳුන්වන අතර, ධාතුන් වහන්සේලා තැන්පත් කොට තිබෙන ගර්භය සහිත වූ ස්ථානය වශයෙන් ද විග්‍රහ කළ හැකිය. ආදි මූලාශ්‍රය අධ්‍යයනය කිරීම මගින් ස්තූප පිළිබඳ ඓතිහාසික කරණු රැසක් අනාවරණය කර ගත හැක. ස්තූප පිළිබඳ මුල්ම සඳහන ඍග් වේදයෙන් ගම්‍ය වේ. එහි සඳහන් ''හිරණ්‍ය ස්තූප, අග්නි ස්තූප'' (රන්ගොඩ, ගිනිගොඩ) ආදී වචන මගින් ස්තූප සංකල්පය වෛදික යුගයේ පටන් පැවත එන බවට සැක නැත. පෙළ දෙස අවධානය යොමු කොට බැලීමෙන් ද ස්තූප පිළිබඳ වැදගත් තොරතුරු රැසක් සොයාගත හැකිය.

බෞද්ධ දර්ශනයට අනුව බලන කල්හි ස්තූපයේ සංවර්ධනය සිදු වූයේ ගැඹුරු යථාර්ථයක් විශද කිරීම සඳහා ගත් උත්සහායක ප්‍රතිඵලයක් වශයෙනි. එසේ විමසා බලන කල්හි දාගැබ හුදු වාස්තු විද්‍යාත්මක ඉදිකිරීමකට වඩා දාරශනිකමය අර්ථයක් ජනනය කරුණු ලබන සුවිශේෂි නිර්මාණයක් වශයෙන් අගය කළ හැකිය. මේ පිළිබඳ අවධානය යොමු කරන ලද බොහෝ උගතුන් දාගැබේ ඒ ඒ අංග සඳහා විවිධ අර්ථකථන ඉදිරිපත් කරන ලදී. මෙම උගත් පිරිස අතර බඹරැන්දේ සිරි සීවලී හිමියන්ට ප්‍රමුඛ ස්ථානයක් හිමි වේ. උන්වහන්සේ මේ පිළිබඳ අධ්‍යයනය කළ මුල් ම විද්වතා වශයෙන් සඳහන් කළ හැකිය. මුන්වහන්සේලා ඉදිරිපත් කරන ලද නව අර්ථ කථන සමග දාගැබ මුල් කරගනිමින් විශාල ධර්ම සන්නිවේදන ජාලයක් ගොඩ නැගී ඇත. මෙම පර්යේෂණයෙහිදී දාගැබේ විකාශනය සම්බන්ධයෙන් මෙන්ම එමගින් ගොඩ නැගෙන ලද සුවිශේෂි ධර්ම සංකල්පයන් පිළිබඳ විධිමත් අධ්‍යයනයක නිරත වීම අපගේ අරමුණයි.

ප්‍රමුඛ පද:- ස්තූපයේ ප්‍රභවය, ස්තූපයේ සංවර්ධනය, ස්තූප ආකෘති, ස්තූපයෙන් නිරූපිත ධර්ම සන්නිවේදනය.

* පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය විශ්ව විද්‍යාලය opathasamithathero@gmail.com